# ජාතික රාජ්‍ය සභාවේ
# 1973 අංක 25 දරණ ක්‍රීඩා
# පනත

ජාතික ක්‍රීඩා සභාවක්, දිස්ත්‍රික් ක්‍රීඩා කමිටු සහ ශ්‍රී ලංකාවේ ජාතික ඔලිම්පික් කමිටුව පිහිටුවීම සඳහා ද ක්‍රීඩා අරමුදලක් ඇති කිරීම සඳහාද ජාතික ක්‍රීඩා සංගම් ලියාපදිංචි කිරීම හා පරිපාලනය කිරීම සඳහා සහ ක්‍රීඩා ශිල්පායතන පිහිටුවීම සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස සහ ඊට සම්බන්ධ හෝ අනුෂාංගික කරුණු විධිවිධාන සැලැස්වීම පිණිසත් වූ පනතකි.

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරණ ක්‍රීඩා පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මඟින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන දිනයක ක්‍රියාත්මක විය යුතුය.

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය

2. මේ පනතෙහි දක්වා ඇති කාර්යයන් සඳහා මේ පනතෙහි මතු දැක්වෙන විධිවිධානවලට අනුකූලව,

ජාතික ක්‍රීඩා සභාවක් ආදිය පිහිටු වීම

අ) ජාතික ක්‍රීඩා සභාවක් ;

ආ) අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි දිස්ත්‍රික් ක්‍රීඩා කමිටු ගණනක්;

ඇ) ශ්‍රී ලංකාවේ ජාතික ඔලිම්පික් කමිටුව;

ඈ) ජාතික ක්‍රීඩා අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් ; සහ

ඉ) අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි ක්‍රීඩා ශිල්පායාතන ගණනක්

පිහිටුවන ලැබිය හැකිය.

3. (1) ක්‍රීඩා අධ්‍යක්ෂකයරයකු පත් කරනු ලැබිය යුතුය. ක්‍රීඩා අධ්‍යක්ෂවරයා වශයෙන් ඔහු වෙත මෙම පනත යටතේ අමාත්‍යවරයා විසින් පවරනු ලබන යුතුකම් හා කාර්යයන් යථා පරිදි ඉටු කිරීම සම්බන්ධයෙන් ඔහු වගකිව යුතුය.

ක්‍රීඩා අධ්‍යක්ෂවරයා සහ වෙනත් නිලධරයන් පත් කිරීම

(2) එක් සහකාර ක්‍රීඩා අධ්‍යක්ෂවරයෙකු හෝ ඊට වැඩි ගණනක් සහ මෙම පනතේ කාර්යයන් සඳහා කලින් කල අවශ්‍ය විය හැකි වෙනත් නිලධරයන් පත් කරනු ලැබිය හැකිය.

(3) මේ වගන්තියේ (1) වන හා (2) වන උපවගන්ති යටතේ පත් කරනු ලබන සියලු නිලධරයන් දණ්ඩ නීති සංග්‍රහයෙන් අර්ථානුකූලව රාජ්‍ය නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතුය.

(4) මෙම පනත යටතේ ක්‍රියා කරන යම් රාජ්‍ය නිලදරයකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ නොකරන හරින ලද යම් දෙයක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව කිසිදු නඩුවක් නොවිය යුතුය.

(5) මේ වගන්තිය යටතේ පත් කරන ලද සියලු නිලධරයන් විසින් තම බලතල ක්‍රියාත්මක කිරීමේදී සහ තම යුතුකම් හා කාර්යයන් ඉටු කිරීමේ දී අමාත්‍යවරයා විසින් හෝ අමාත්‍යාංශයේ ලේකම් විසන් නිකුත් කරනු ලබන පොදු හෝ විශේෂ විධානවලට අනුකූලව ක්‍රියා කල යුතු ය.

## I වන කොටස

## ජාතික ක්‍රීඩා සභාවක්, දිස්ත්‍රික් ක්‍රීඩා කමිටු හා ශ්‍රී ලංකාවේ ජාතික ඔලිම්පික් කමිටුවක් පිහිටුවීම

ජාතික ක්‍රීඩා සභාව පිහිටු වීම

4.(1) ශ්‍රී ලංකාවේ ක්‍රීඩා දියුණු කිරීම, සංවර්ධනය කිරීම සහ පාලනය කිරීම පිළිබඳ කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් දීම සඳහා, මෙහි මින් මතු “සභාව” යනුවෙන් සඳහන් කරනු ලබන සහ “ජාතික ක්‍රීඩා සභාව” යනුවෙන් හඳුන්වනු ලබන සභාවක් පිහිටුවනු ලැබිය යුතුය.

(2) ඒ සභාව

(අ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සභාපතිවරයකුගෙන් සහ වෙනත් සාමාජිකයන් දොළොස් දෙනෙකුගෙන්;

(ආ) ක්‍රීඩා අධ්‍යක්ෂවරයාගෙන් ;සහ

(ඇ) අමාත්‍යවරයා විසික් පත් කරනු ලබන ලේකම්වරයෙකුගෙන් සමන්විත විය යුතුය.

(3) සභාවට පත් කරනු ලැබූ සාමාජිකයකු තමා එහි සාමාජිකත්වය දරන තාක් කල් ශ්‍රී ලංකාවේ යම් ජාතික ක්‍රිඩා සංගමයක හෝ වෙනත් ක්‍රීඩා මණ්ඩලයක හෝ සංවිධානයක ධූර දැරීම නතර කළ යුතුය.

සභාවේ ක්‍රියාකාරීත්වය සහ යුතුකම්

5. සභාවේ ක්‍රියාකාරීත්වය හා යුතුකම් සහ සභාවේ රැස්වීම් සඳහා ගණපූරණය මෙම පනතේ විධිවිධානවලට යටත්ව නියෝග මඟින් නියම කරනු ලැබිය යුතුය.

රීති

6. සභාවේ රැස්වීම්වල කාර්ය පටිපාටිය සහ ඒ රැස්වීම්වල කටයුතු විධිමත් කිරීම සඳහා සභාව විසින් රීති සෑදිය හැකිය.

සභාවේ සාමාජිකයන්ගේ ධූරය හිස්වීම, ඔවුන් ඉවත් කිරීමට ආදිය

7.(1) අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබූ සභාවේ සභාපති, මෝ ලේකම් මෝ සාමාජිකයන් මිය යාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් කලින් ධූරය හිස් වුවහොත් මිස, තුන් අවුරුදු කාල සීමාවක් ධූර දැරිය යුතුය.

(2) අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබූ සභාවේ සභාපති, ලේකම් හෝ යම් සාමාජිකයකු ධූරයෙන් ඉවත් කිරීම අවස්ප◌ාවෝචිත බව අමාත්‍යවරයා සලකතහෙ◌ාත් හේතු නොදක්වා ඔහු විසින් එසේ නළ හැකි අතර ඒ ඉවත් කිරීම යම් අධිකරණයක දී ප්‍රශ්ණ නොකල යුතුය.

(3) මිය යාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබී ගමන් සභාපතිගේ, ලේකම්ගේ හෝ සාමාජිකයකුගේ ධූරය හිස් වූ විට එසේ හිස් වූ ධූරය දැරූ තැනැත්තා වෙනුවට පත් කරනු ලබන යම් තැනැත්තකු හිස් වූ ධූරය දැරූ තැනැත්තැගේ ධූර කාලයෙන් ගත නොවී ඇති කාලය සඳහා පමණක් ධූරය දැරිය යුතුය.

8. යම් තැනැත්තකු

(අ) නිසි බලය ඇති අධිකරණයක් විසින් උමතු තැනැත්තකු ලෙස විනිශ්චය කරනු ලැබුවහොත් හෝ විනිශ්චය කරනු ලැබ සිටිතහොත් ; හෝ — නුසුදුසුකම්

(ආ) නිසි බලය ඇති අදිකරණයක් විසින් බුන්වත් හෝ බංකොලත් තැතැත්තකු වශයෙන් විනිශ්චය කරනු ලැබුවහොත් හෝ විනිශ්චය කරනු ලැබ සිටියහොත්; හෝ

(ඇ) ක්‍රීඩා භාණ්ඩ, ක්‍රීඩා ආම්පන්න හෝ ක්‍රීඩා උපකරණ කිසිවක් තැනිමෙහි, කොටසක් එක්කර සෑදීමෙහි, විකිණිමෙහි හෝ නිෂ්පාදනය කිරීමෙහි ලා කෙළින්ම හෝ අන් අසුරකින් සම්බන්ධතාවක් දරනහොත් ; හෝ

(ඈ) අමාත්‍යවරයාගෙන් මතය අනුව චරිත දූෂණාත්මතක වූ යම් වරදකට අධිකරණයක දී වරදකරුවකු කරනු ලැබුවහොත්

ඒ තැනැත්තා සභාවේ සේවය කිරීමට නුසුදුසු විය යුතුය.

9. කාලය ඉකුත් වීමෙන් ධුරය හිස් කරන සාමාජිකයකු නැවත පත් කරනු ලැබීමට සුදුසු විය යුතුය. — නැවත පත් කරනු ලැබීමට සාමාජිකයකු සුදුසු බව

10. අමාත්‍යවරයා විසින් පත් කරන ලද යම් සාමාජිකයකු අසනීප වීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙන යම් හේතුවක් නිසා ඔහුගේ ධුරයේ යුතුකම් ඉටු කිරීමට තාවකාලිකව අපොහොසත් වුවහොත් සාමාජිකයකු වශයෙන් ඔහු වෙනුවෙන් වැඩ බැලීමට අමාත්‍යවරයා විසින් අන් කිසි තැනැත්තකු පත් කරනු ලැබිය හැකිය. — වැඩ බලන සාමාජිකයන් පත් කිරීම

11. (1) ඒ ඒ දිස්ත්‍රික්කයේ ක්‍රීඩා නගාසිටුවීමට, සංවර්ධනය කිරීමට සහ පාලනය කිරීමට අදාළ කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් දීම පිණිස අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි එක් එකි පරිපාලන දිස්ත්‍රික්කය සඳහා "දිස්ත්‍රික් ක්‍රීඩා කමිටුවක්" ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයන් මඟින් ඔහු විසින් පිහිටුවනු ලැබිය හැකිය. — දිස්ත්‍රික් ක්‍රීඩා කමිටු පිහිටු වීම

(2) පරිපාලන දිස්ත්‍රික්කයක් සඳහා පිහිටුවනු ලබන සෑම දිස්ත්‍රික් ක්‍රීඩා කමිටුවක් ම අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සභාපතිවරයෙකුගෙන්, ලේකම්වරයකුගෙන් සහ දහතුන් දෙනෙකුට වැඩි නොවන තවත් සාමාජික සංඛ්‍යාවකගෙන් සමන්විත විය යුතුය.

12. මේ පනතේ විධිවිධානවලට යටත්ව දිස්ත්‍රික් ක්‍රීඩා කමිටුවල ක්‍රියාකාරීත්වය හා යුතුකම් සහ ඒ කමිටුවල රැස්වීම්වල ගණපූරණය නියෝගය මඟින් නියම කරනු ලැබිය යුතුය. — දිස්ත්‍රික් ක්‍රීඩා කමිටුවල ක්‍රියාකාරීත්වය සහ යුතුකම්

13. සෑම දිස්ත්‍රික් ක්‍රීඩා කමිටුවක් විසින් ඒ කමිටුවේ රුස්වීම්වල කාර්යය පටිපාටිය සහ ඒ රැස්වීම්වල කටයුතු විධිමත් කිරීම සඳහා රීති සෑදිය හැකිය — දිස්ත්‍රික් ක්‍රීඩා කමිටුවල රීති

සාමාජිකයන්ගේ ධූර හිස් වීම ආදිය

14. (1) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන යම් දිස්ත්‍රික් ක්‍රීඩා කමිටුවක සාමාජිකයන්, මිය යාමෙන් හෝ ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් කලින් ධූරය හිස් වුවහොත් මිස, තුන් අවුරුදු කාල සීමාවක් ධූර දැරිය යුතුය.

(2) දිස්ත්‍රික් ක්‍රීඩා කමිටුවකට අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබූ යම් සාමාජිකයකු ධූරයෙන් ඉවත් කිරීම අවස්ථාවෝචිත ඉව අමාත්‍යවරයා සලකතහොත් හේතු නොදක්වා ඔහු විසින් එසේ කල හැකි අතර ඒ් ඉවත් කිරීම යම් අධිකරණයක දී ප්‍රශ්ණ නොකළ යුතුය.

(3) මිය යාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් ධූරය හිස්වන යම් සාමාජිකයකු වෙනුවට පත් කරනු ලබන යම් තැනැත්තකු එසේ හිස් වූ ධූරය දැරූ සාමාජිකයාගේ ධූර කාලයෙන් ගත නොවී ඇති කාලය සඳහා පමණක් ධූරය දැරිය යුතුය.

සාමාජිකයන් නැවත පත් කිරීම

15. කාලය ඉකුත්වීමෙන් ධූරය හිස් කරන සාමාජිකයකු නැවත පත් කරනු ලැබීමට සුදුසු විය යුතුය.

වැඩ බලන සාමාජිකයන්

16. අසනීප වීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙන යම් හේතුවක් නිසා තම ධූරයේ යුතුකම් ඉටු කිරීමට යම් සාමාජිකයකු තාවකාලිකව අපොහොසත් වුවහොත් ඔහු වෙනුවෙන් සාමාජිකයකු වශයෙන් වැඩ බැලීමට අන් කිසි තැනැත්තකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකිය.

දිස්ත්‍රික් ක්‍රීඩා කමිටුවක සාමාජිකයන් වශයෙන් සේවය කිරීම සඳහා නුසුදුසුකම්

17. යම් තැනැත්තකු

(අ) නිසි බලය ඇති අධිකරණයක් විසින් උමතු තැනැත්තකු ලෙස විනිශ්චය කරනු ලැබුවහොත් හෝ විනිශ්චය කරනු ලැබ සිටියහොත් ; හෝ

(ආ) නිසි බලය ඇති අධිකරණයක් විසින් බුන්වත් හෝ බංකොලොත් තැනැත්තකු වශයෙන් විනිශ්චය කරනු ලැබුවහොත් හෝ විනිශ්චය කරනු ලැබ සිටියහොත් ; හෝ

(ඇ) ක්රීඩා භාණ්ඩ, ක්‍රීඩා ආම්පන්න හෝ ක්‍රීඩා උපකරණ කිසිවක් තැනිමෙහි, කොටසක් එක්කර සැදීමෙහි, විකිණීමෙහි හෝ නිෂ්පාදනය කිරීමෙහි ලා කෙළින්ම හෝ අන් අයුරකින් සම්බන්ධතාවක් දරනහොත් ; හෝ

(ඈ) අමාත්‍යවරයාගෙන් මතය අනුව චරිත දූෂණාත්මතක වූ යම් වරදකට අධිකරණයක දී වරදකරුවකු කරනු ලැබුවහොත්

ඒ තැනැත්තා යම් දිස්ත්‍රික් ක්‍රීඩා කමිටුවක සේවය කිරීමට නුසුදුසු විය යුතුය.

ශ්‍රී ලංකාවේ ජාතික ඔලිම්පික් කමිටුව පිහිටුවීම

18. (1) "ශ්‍රී ලංකාවේ ජාතික ඔලිම්පික් කමිටුව" යනුවෙන් හඳුන්වනු ලබන කමිටුවක් පිහිටවනු ලැබිය හැකිය.

(2) ඒ කමිටුව පහත සඳහන් තැනුත්තන්ගෙන් සමන්විත විය යුතුය:-

(අ) ශ්‍රී ලංකාවේ අන්තර්ජාතික ඔලිම්පික් කමිටුවේ සාමාජිකයන් කිසිවෙකු වෙතොත් එකී සාමාජිකයෝ: ඔවුන් (ආ) ඡේදය යටතේ පත් කරනු ලැබුවහොත් මිස නිල බලයෙන් පත් වන, ඡන්දය අහිමි සාමාජිකයන් විය යුතුය; තවද

(ආ) මේ පනතෙහි මින් මතු එන විධිවිධානවලට අනුකූලව ලියාපදිංචි කරන ලද එක් එක් ජාතික ක්‍රීඩා සංගමයෙන් නියෝජිතයන් දෙදෙනෙක්; එහෙත් මේ සඳහා ඒ එක් එක් ජාතික ක්‍රීඩා සංගමය ඊට උචිත අන්තර්ජාතික ඒකාබද්ධ සංගමයක් විය යුතු අතර ඒ සංගමය පෙනී සිටින ක්‍රීඩා, ඔලිම්පික් ක්‍රීඩා වැඩ සටහනට ඇතුළත් ක්‍රීඩා විය යුතුය.

ලියාපදිංචි කරන ලද වෙනත් ජාතික ක්‍රීඩා සංගම්වල අභිනියෝජිතයන් හෝ ඔලිම්පික් ව්‍යාපාරයට විශිෂ්ට සේවයක් සලසා ඇති හෝ සැලසිය හැකි තැනැත්තන් එම කමිටුව විසින අමතරව එක් කළ ගත හැකිය. එසේ වුවද ඒ අමතරව එක් කර ගන්නා සාමාජිකයන්ගෙන් කමිටුවේ ඡන්දය හිමි බහුතර සංඛ්‍යාව සංයුක්ත නොවිය යුතුය.

19. ඒ කමිටුවේ ක්‍රියාකාරීත්වය, බලතල සහ යුතුකම් නියෝග මඟින් නියම කරනු ලැබිය යුතුය. කමිටුවේ ක්‍රියාකාරීත්වය යනාදිය

20. කමිටුවෙ රැස්වීම්වල කාර්ය පටිපාටිය සහ ඒ රැස්වීම්වල කටයුතු විධිමත් කිරීම සඳහා ඒ කමිටුව විසින් රීති සෑදිය හැකිය. කමිටුවේ රීති

21. යම් තැනැත්තකු- නුසුදුසුකම්

(අ) නිසි බලය ඇති අධිකරණයක් විසින් උමතු තැනැත්තකු ලෙස විනිශ්චය කරනු ලැබුවහොත් හෝ විනිශ්චය කරනු ලැබ සිටියහොත්; හෝ

(ආ) නිසි බලය ඇති අධිකරණයක් විසින් බුන්වත් හෝ බංකලොත් තැනැත්තකු වශයෙන් විනිශ්චය කරනු ලැබුවහොත් හේ විනිශ්චය කරනු ලැබ සිටියහොත්; හෝ

(ඇ) ක්‍රීඩා භාණ්ඩ, ක්‍රීඩා ආම්පන්න හෝ ක්‍රීඩා උපකරණ කිසිවක් තැනීමෙහි, කොටස් එක් කර සෑදිමෙහි , විකිණීමෙහි ලා කෙළින්ම හෝ අන් අයුරකින් සම්බන්ධතාවක් දරතහොත්; හෝ

(ඈ) අමාත්‍යවරයාගේ මතය අනුව චරිත දූෂණාත්මක වූ යම් වරදකට අධිකරණයකදී වරදකරු කරනු ලැබුවහොත්

ඒ තැනැත්තා ඒ කමිටුවේ සේවය කිරීමට නුසුදුසු විය යුතුය.

22. ශ්‍රී ලංකාවේ ක්‍රීඩාවලට ධෛර්යයදීම, ඒවා දියුණු කිරීම හා සංවර්ධනය කිරීම සඳහා, මෙහි මින්මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන්නා වූ හා ජාතික ක්‍රීඩා අරමුදල යනුවෙන් හැඳින්වෙන්නා වූ අරමුදලක් පිහිටුවනු ලැබිය යුතුය. ජාතික ක්‍රීඩා අරමුදල පිහිටුවීම

23. (අ) අරමුදලේ කාර්යයන් සඳහා කලින් කල ජාතික රාජ්‍ය සභාව විසින් සම්මත කරනු ලැබිය හැකි සියලු මුදල්; අරමුදලට කළ යුතු ගෙවීම

(ආ) යම් විදේශීය රටකින් අධාර වශයෙන් ලැබෙන සියළු මුදල්;

(ඇ) යම් තැනැත්තකු විසින් අරමුදලට කරන ලද පරිත්‍යාග වශයෙන් ලැබෙන සියළු මුදල්; සහ

(ඈ) වෙන යම් මාර්ගයකින් ලැබෙන මුදල්

අරමුදලට ගෙවනු ලැබිය යුතුය.

එසේ වුවද යම් නිශ්චිත කාර්යයන් සඳහා ප්‍රයෝජනයට ගත යුුුතු වීමේ කොන්දේසිය පිට මේ වගන්තියේ (අ), (ඇ), හෝ (ඈ) ඡේද යටතේ මුදලක් ලැබුණු අවස්ථාවක ඒ මුදල් අරමුදලේ බැරට භාර ගැනීම සම්පූර්ණයෙන්ම අමාත්‍යවරයාගේ අභිමතය අනුව විය යුතුය :

එසේම තවදුරටත්, ප්‍රදාන හෝ පරිත්‍යාග කිරීම පිණිස යොදා ගැනීමට හෝ යම්කිසි නිශ්චිත කාර්යයන් සඳහා භාරයක් වශයෙන් තබා ගැනීමට අමාත්‍යවරයාගේ අභිමතය අනුව මුදල් භාරගනු ලැබිය හැකි අතර ඒ මුදල් අරමුදලට බැර නොකර, වෙනම තබා ගත හැකි ය.

24. යම් නිශ්චල හෝ චංචල දේපළ පරිත්‍යාගයක් මේ පනතේ කාර්යයන් සඳහා යෙදීම පිණිස ශ්‍රී ලංකා ජනරජය වෙනුවෙන් අමාත්‍යවරයා විසින් පිළිගනු ලැබිය හැකිය. එවැනි යම් දේපළක් අමාත්‍යවරයාගේ අභිමතය පිරිදි සහ ඔහු විසින් නිශ්චය කරනු ලබන අකාරයට විකුණා එ් විනිණීමෙන් ලැබෙන මුදල් අරමුදලට බැර කරනු ලැබිය හැකිය.

චංචල සහ නිශ්චල දේපළ පරිත්‍යාග

25. (1) අරමුදල අමාත්‍යවරයාගේ පාලනය සහ පරිපාලනය යටතේ තිබිය යුතු අතර එය අමාත්‍යවරයාගේ විධිවිධානවලට යටත්ව අමාත්‍යංශයේ ලේකම් විසින් පරිපාලනය කළ යුතුය.

අරමුදලෙහි පරිපාලනය

(2) එක් එක් ලිත් වර්ෂය ඉකුත් වූ පසු හැකි තාක් ඉක්මණින් අරමුදලේ පරිපාලනය පිළිබඳ වර්තාවක් අමාත්‍යංශයේ ලේකම් විසින් පිළියෙළ කළ යුතුය.

(3) එක් එක් ලිත් වර්ෂය සම්බන්ධයෙන් පරිපූර්ණ ලෙස හා උචිත ලෙස අරමුදලේ ගණන් හිලව් තබාගෙන යාමට අමාත්‍යංශයේ ලේකම් විසින් සැලැස්විය යුතුය.

(4) 1971 අංක 38 දරන මුදල් පනතෙහි II වන කොටසේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අරමුදලේ මුදල් පාලනය හා ගණන් හිලව් සම්බන්ධයෙන් අදාළ විය යුතුය.

(5) අරමුදලේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතුය.

26. අමාත්‍යවරයා විසින් හැකිතාක් ඉකිමනින් එක් එක් ලිත් වර්ෂය සඳහා වූ අරමුදලේ පරිපාලනය පිළිබඳව වාර්තාවන්, එම අරමුදලේ විගණනය කරන ලද එම වර්ෂයේ ගණන්වල පිටපතක්ද, ඒ ගණන් පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව ද සමඟ, ජාතික රාජ්‍ය සභාව හමුවේ තැබිය යුතුය.

අරමුදල පිළිබඳ වාර්තාව

27. අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි මුදල් ප්‍රමාණයන් -

අරමුදලින් කරනු ලබන ගෙවීම්

(අ) ශ්‍රී ලංකාවේ යම් ක්‍රීඩාවකට ධෛර්යය දීම, එය දියුණු කිරීම හා සංවර්ධනය කිරීම සඳහා ද;

(ආ) ක්‍රීඩා විෂයෙහි ලබා දී ඇති යම් සම්මානයකට සැලකිලි වශයෙන් ක්‍රීඩාවලට දැනට සහභාගිවන්නන්ට හෝ ඉහතදී සහභාගීවූවන්ට කරුණා සහගත ගෙවීම් වශයෙන්ද ;

(ඇ) යම් බැංකුවක ස්ථිර තැන්පතු ලෙස හෝ ආණ්ඩුවේ යම් ණය මුදලක හෝ ණයකරවල ආයෝජනය කිරීම සඳහා ; සහ

(ඈ) මේ පනතේ විධිවිධාන ක්රියාත්මක කිරීමේ හෝ බල ගැන්වීමේ කාර්යය සඳහාද

ඔහු විසින් අරමුදලෙන් ගෙවනු ලැබිය හැකිය.

## III වන කොටස

**ජාතික ක්‍රීඩා සංගම් ලියාපදිංචි කිරීම සහ අනුපාලනය කිරීම.**

ක්‍රීඩාවක් හෝ ක්‍රීඩා පන්තියක් නම් කිරීම

28. ජාතික ක්‍රීඩා සංගමයක් පිහිටුවිය හැකි යම් ක්‍රීඩාවක් හෝ ක්‍රීඩා පන්තියක් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මඟින් අමාත්‍යවරයා විසින් නම් කරනු ලැබිය හැකිය.

ජාතික ක්‍රීඩා සංගම් ලියාපදිංචි කිරීම

29. 28 වන වගන්තිය යටතේ වූ නියමයන් මඟින් යම් ක්‍රීඩාවක් හෝ ක්‍රීඩා පන්තියක් නම් කරනු ලැබූ කල්හි -

(අ) ඒ නියමය කරනු ලැබූ අවස්ථාවේ ඒ ක්‍රීඩාව හෝ ක්‍රීඩා පන්තිය පිළිබඳව පවත්නා වූ ජාතික සංගමයක්, ඒ නියමය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු මාස තුනක් ඇතුළතදී මේ පනතෙහි මින් මතු එන විධිවිධානවලට අනුකූලව, ලියාපදිංචි වීම සඳහා ඉල්ලුම් කළ යුතුය ; තවද

(ආ) ඒ නියමය කරනු ලැබූ දිනයෙන් පසු පිහිටුවනු ලබන එ් ක්‍රීඩාව හෝ ක්‍රීඩා පන්තිය පිළිබඳ යම් පන්තිය පිළිබඳ යම් ජාතික සංගමයක්, එය පිහිටුවා මාස තුනක් ඇතුළතදී මේ පනතෙහි මින් මතු එන විට විධිවිධාවවලට අනුකූලව, ලියාපදිංචි වීම සඳහා ඉල්ලුම් කළ යුතුය.

ජාතික ක්‍රීඩා සංගම්වල තීරණවලට සහ ක්‍රියාවලට විරුද්ධ අභියාචනා

30. ලියාපදිංචි කල ජාතික ක්‍රීඩා සංගමයක යම් තීරණයකින් හෝ ක්‍රියාවකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, මේ පනතේ මින් මතු එන විධිවිධාන වලට අනුකූලව, ඒ තීරණයට හෝ ක්‍රියාවට විරුද්ධව අමාත්‍යවරයා වෙත අභියාචනා කල හැකිය. ඒ අභියාචනය සම්බන්ධයෙන් අමාත්‍යවරයාගේ තීරණය අවසානාත්මක හා තීරණාත්මක විය යුතු අතර එය යම් අධිකරණයකදී ප්‍රශ්න කරනු නොලැබිය යුතුය.

ජාතික ක්‍රීඩා සංගම් ලියාපදිංචි කිරීමේ කාර්යය පටිපාටිය හා ඒවායේ සංයුතිය, සංස්ථාපනය, යුතුකම්, බලතල සහ කාර්යයන් ආදිය

31. අමාත්‍යවරයා විසින් පහත සඳහන් කරුණු නියෝග මඟින් නියම කරනු ලැබිය හැකිය.

(අ) ජාතික ක්‍රීඩා සංගම් ලියාපදිංචි කිරීමේ කාර්ය පටිපාටිය සහ ඒවා ලියාපදිංචි කිරීම සඳහා අය කළ යුතු ගාස්තු;

(ආ) සංගම්වල සංයුතිය හා සංස්ථාපනය;

(ඇ) ඒ සංගම්වල යුතුකම්, බලතල සහ කාර්යයන්;

(ඈ) ඒ සංගම්වල තීරණවලට හෝ ක්‍රියාවලට විරුද්ධව අභියාචනා ඉදිරිපත් කිරීමේ කකාර්යය පටිපාටිය; සහ

(ඉ) ඒ සංගම් විසින් ප්‍රගුණකයන්, තීරකයන්, පසිඳලන්න් සහ විනිශ්චයනරුවන් පත් කිරීමේ කාර්යය පටිපාටිය.

32. (අ) සංගමයේ නිලධාරීන්ගේ හෝ සාමාජිකයන්ගේ දූෂණ, විෂමාචාරය හෝ අක්‍රමිකතා යමක් සඳහා ප්‍රතිකර්ම යොදන ලෙස අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ලිඛිත නිවේදනයන් මඟින් දැනුම් දෙනු ලැබූ විට ඒ නිවේදනයයේ සඳහන්ය තිබිය හැකි කාලය තුළදී එසේ ප්‍රතිකර්ම යෙදිමට අපොහොසත් වීම හෝ ප්‍රතිකර්ම යෙදීම නොසලකා හැරීම නිසා; හෝ

(ආ) අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමෙහිලා අකර්මණ්‍යව සිටීම, සහයෝගය නොදීම හෝ අවහිර කිරීම නිසා ; හෝ

(ඇ) සංගමයේ යුතුකම් හා කාර්යයන් ඉටු කිරීම පැහැර හැරීම නිසා

ජාතික ක්‍රීඩා සංගම් ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීම, අත්හිටුවීම සහ අවලංගු කිරීම

ජාතික ක්‍රීඩා සංගමයක් ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීම හෝ එහි ලියාපදිංචිය අත්හිටු වීම හෝ අවලංගු කිරීම අමාත්‍යවරයා විසින් කරනු ලැබිය හැකිය.

මේ වගන්තියේහි “අමාත්‍යාංශයේ ලේකම්වරයා” යන්නට ක්‍රීඩා අධ්‍යක්ෂකවරයා, සහකාර ක්‍රීඩා අධ්‍යක්ෂනයරයෙක් හෝ අමාත්‍යාංශයේ සහකාර ලේකම්වරයෙක් ඇතුළත් වේ.

33. අත්හිටුවනු ලැබූ හෝ ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබූ නැතහොත් අවලංගු කරනු ලැබූ ජාතික ක්‍රීඩා සංගමයක කාර්යයන් කරගෙන යාම සඳහා තාවකාලික කාර්යක්‍රම අමාත්‍යවරයා විසින් ඇති කල හැකිය.

තාවකාලික කාර්යය ක්‍රමය

34. (1) 29 වන වගන්තිය යටතේ ලියාපදිංචි වීම සඳහා ඉල්ලුම් නොකළ හෝ ලියාපදිංචි කිරීම 32 වන වගන්තිය යටතේ ප්‍රතික්ෂේප කරන ලද හෝ අවලංගු කරන ලද යම් ජාතික ක්‍රීඩා සංගමයක් විසුරුවා හරින ලෙස ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මඟින් අමාත්‍යවරයා විසින් නියම නළ හැකි අතර, ඒ නියමෙහි සඳහන් කර තිබිය යුතු කාලය තුළදී ඒ සංගමය විසිරුවා හැරීමෙන් හා එහි කටයුතු අවසන් කරලීමෙන් ඒ සංගමයේ නිලධරයන් විසින් ඒ නියමය ක්‍රියාවේ යෙදවිය යුතුය.

ජාතික ක්‍රීඩා සංගම් විසුරුවා හැරීම

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වූ විසුරුවා හැරීමේ නියමයක් ක්‍රියාවෙහි නොයොදවන හෝ එසේ ක්‍රියාවෙහි නොයොදවන හෝ එසේ ක්‍රියාවෙහි යෙදවීම නොසලකා හරින ජාතික ක්‍රීඩා සංගමයක නිලධරයන් වරදක් කරන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් බඝු වරදකරුවන් කරනු ලැබූ විට රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට හෝ එක් අවුරුද්දකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කරනු ලැබීම යන දෙකටම හෝ යටත් විය යුතුය.

(3) ජාතික ක්‍රීඩා සංගමයක් විසුරුවා හැරීමේ නියමයන් මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ කරනු ලැබ ඇති විට සහ ඒ නියමය ක්‍රියාවෙහි යෙදවීම සඳහා සඳහන් කාලසීමාව ඉකුත් වී ඇති විට, ඉන් පසු එම සංගමයේ සාමාජිකයකු වන හෝ සාමාජිකත්වය පවත්වාගෙන යන යම් තැනැත්තකු වරදක් කරන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට හෝ එක් අවුරුද්දකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කරනු ලැබීම යන දෙකටම සහ එසේ වරදකරු කරනු ලැබූ පසු තවදුරටත් ඔහු ඒ සංගමයේ සාමාජිකයකුව සිටින එක් එක් දිනය සඳහා රුපියල් පනහකට නොවැඩි අමතර දඩයකටද යටත් විය යුතුය.

35. යම් ජාතික ක්‍රීඩා සංගමයක් සම්බන්ධයෙන් 34 (1) වන වගන්තිය යටතේ කරන ලද විසුරුවා හැරීමේ නියමයක් ප්‍රත්‍යාදිෂ්ට් කිරීම අවස්ථාවෝචිත බව අමාත්‍යවරයා සළකතහොත් එසේ ප්‍රත්‍යාදිෂ්ට කිරීමද අලුතින් නිලධරයන් තෝරා ගන්නා ලෙස හා යම් දූෂණ, විෂමචාර හෝ අක්‍රමිකතා තිබේ නම් ඒවාට ප්‍රතිකර්ම යොදන ලෙසද අමාත්‍යවරයා විසින් ඒ සංගමයේ සාමාජිකයන්ට නියම කළ හැකිය. ඉන් පසු තම අභිමතය අනුව අමාත්‍යවරයා විසින් ඒ සංගමය ලියාපදිංචි කිරීමට හෝ නැවත ලියාපදිංචි කිරීමට අවසර දිය හැකිය.

විසුරුවා හැරීමේ නියමයන් ප්‍රත්‍යාදිෂ්ට කිරීමේ බලය

## IV කොටස

## ක්‍රීඩා ශිල්පායතන පිහිටුවීම.

ක්‍රීඩා ශිල්පායතන පිහිටුවීම

36. අමාත්‍යවරයා විසින් පහත සඳහන් කාර්යයන් සඳහා ශිල්පායතනයක් හෝ ශිල්පායතන ගණනක් පිහිටවනු ලැබිය හැකිය.

(අ) ක්‍රීඩා සහ ශාරීරික අධ්‍යාපනය පිළිබඳ දැනුම, උපදෙස් සහ පුහුණුව ලබා දීම.

(ආ) එම ශිල්පායතනවල ශිෂ්‍යන් විසින් ලබා ඇති ප්‍රවීණතාව නිශ්චය කිරීම සඳහා විභාග පැවැත්වීම ; සහ

(ඇ) එම ශිල්පායතන විසින් පවත්වනු ලබන විභාගවලින් සමත් වූ අයට උපාධි හා අභිඥන පත්‍ර පිරිනැමීම සහ සහතික පත්‍ර ප්‍රධානය කිරීම.

ක්‍රීඩා ශිල්පායතනවලට ඇතුළත් කිරීමේ පටිපාටි සහ ඒවායේ අධ්‍යයන පටිපාටිය

37.අමාත්‍යවරයා විසින් නියෝග මඟින් -

(අ) ශිල්පායතනවලට ඇතුළත් කර ගැනීමේ පටිපාටි ;

(ආ) ඒ ශිල්පායතනවල අධ්‍යාපනය, පුහුණුව සහ විභාග පිළිබඳ පටිපාටි ; සහ

(ඇ) අවශ්‍ය විය හැකි පරිදි ඒ ශිල්පායතනවලට අධ්‍යක්ෂවරුන්, සහකාර අධ්‍යක්ෂවරුන්, ගුරුවරුන්, උපදේශනයන් සහ වෙනත් නිලධරයන් පත් කිරීමසහ ඔවුන්ට වැටුප් ගෙවීම පිළිබඳ පටිපාටි

නියම කරනු ලැබිය හැකිය.

ක්‍රීඩා ශිල්පායතනවල පහසුකම් සැපයීම, විනය පාලනය ආදීය සඳහා අමාත්‍යවරයා සතු බලය

38. අමාත්‍යවරයාට -

(අ) ඒ ශිල්පායතනවලට පහසුකම් සැපයීම සහ පුහුණුව, නේවාසික පහසුකම් හා ඒ ශිල්පායතනවල වෙනත් කාර්යයන් සඳහා ගොඩනැඟිලි ඉදි කිරීම, ඒවා නඩත්තු කිරිම සහ උපකරණ සජ්ජිත කිරිම සඳහාද;

(ආ) ඒ ශිල්පායතනවල ශිෂ්‍යයන්ගේ සහ අචාර්ය මණ්ඩලයේ විනය සහ ශුභ සාධනය ඇති කිරීම හා විධිමත් කිරීම සඳහා ද;

(ඇ) ඒ ශිල්පායතන මඟින් උපාධි, අභිඥ පත්‍ර සහ සහතික පත්‍ර ප්‍රදානය කිරීමට විධිවිධාන සැලැස්වීම සඳහා; සහ

(ඈ) ඒ ශිල්පායතනවලට ශිෂ්‍යයන් ඇතුළත් කිරීමේ විධිවිධාන සැලැස්වීම සඳහාද

බලය තිබිය යුතුය.

## V වන කොටස

## පොදු විධිවිධාන

39. (1) මේ පනත යටතේ පිහිටුවන ලද හෝ ලියාපදිංචි කරන ලද සභාවල, කමිටුවල, සංගම්වල සහ වෙනත් මණ්ඩලවල බලතල ක්‍රියාවෙහි යෙදවීම, කාර්යයන් කිරීම සහ යුතුකම් ඉටු කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් ඒ සභා, කමිටු, සංගම් හෝ මණ්ඩල වෙත පොදු හෝ විශේෂ ලිඛිත විධාන නිකුත් කරනු ලැබිය හැකි අතර ඒ සභා, කමිටු, සංගම් හෝ වෙනත් මණ්ඩල විසින් ඒ විධාන ත්‍රියාවෙහි යෙදවිය යුතුය. අමාත්‍යවරයා සතු බලතල

(2) මේ පනත යටතේ පිහිටුවන ලද හෝ ලියාපදිංචි කරන ලද සභාවල, කමිටුවල, සංගම්වල සහ වෙනත් මණ්ඩලවල දේපළ සහ කටයුතු සම්බන්ධයෙන් වූ වාර වාර්තා, ගණන් සහ වෙනත් තොරතුරු තමාට අවශ්‍ය විය හැකි ආකාරයෙන් තමා වෙත සපයන ලෙස අමාත්‍යවරයා විසින් ඒ සභාවලට, කමිටුවලට, සංගම්වලට සහ වෙනත් මණ්ඩලවලට කලින් කල විධාන කළ හැකි අතර, ඒ සභා, කමිටු, සංගම් සහ වෙනත් මණ්ඩල ඒ සෑම විධානයක්ම අනුව ක්‍රියා කළ යුතුය.

(3) මේ පනත යටතේ පිහිටුවන ලද හෝ ලියාපදිංචි කරන ලද සභාවලට, කමිටුවලට, සංගම්වල සහ වෙනත් මණ්ඩලවල කටයුතු සියල්ලම හෝ ඉන් යමක් තමන් විසින් නිශ්චය කරනු ලැබිය හැකි තැනැත්තකු හෝ තැනැත්තන් විසින් විමර්ශණය කර වාර්තා කරන ලෙස අමාත්‍යවරයා විසින් කලින් කල නියම කළ හැකි අතර එසේ නියම කරනු ලැබූ කල්හි ඒ ඒ සෑම නියමයන් ම ක්‍රියාවෙහි යෙදවීම සඳහා අවශ්‍ය විය හැකි සියලු පහසුකම් සැලැස්වීම සහ සියලු තොරතුරු සැපයීම ඒ සභා, කමිටු, සංගම් සහ වෙනත් මණ්ඩල විසින් කළ යුතුය.

40. ශ්‍රී ලංකාව නියෝජනය කරතියි සැලකෙන තනි තනි ක්‍රීඩකයන් හෝ ක්‍රීඩක කණ්ඩායම් ශ්‍රී ලංකාවේදී හෝ විදේශයකදී හෝ ක්‍රීඩවලට සහභාගී වීම නියෝග මඟින් විධිමත් කිරීම ද පාලනය කිරීමද අමාත්‍යවරයා විසින් කළ හැකි ය. ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ක්‍රීඩාවලට සහභාගීවන්නන් පාලනය කිරීමට අමාත්‍යවරය සතු බලය

41. (1) මේ පනතේ ප්‍රතිපත්ති සහ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හෝ බලගැන්වීමේ කාර්යය සඳහාත් නියම කරනු ලැබීමට මේ පනතින් නියමිත හෝ නියෝග සෑදීමට මේ පනතින් නියමිත සියලු කරුණු සඳහාත් අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකිය. නියෝග සෑදීමේ බලය

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයෙහි පළ කළ යුතු අතර, එසේ පළ කරනු ලබන දිනයෙහි හෝ ඒ නියෝගයෙහි සඳහන් කර තිබිය හැකි පසු දිනයක එය ක්‍රියාත්මක විය යුතුය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මනින් අනුමැතිය සඳහා ජාතික රාජ්‍ය සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.

එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එය අනුමැතියේ දිනයේ සිට පරිච්ඡින්න වූ ලෙස සැලකිය යුතු නමුදු ඒ යටතේ කලින් කරන ලද යම් දෙයකට ඉන් හානියන් නොවිය යුතුය. අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ යම් නියෝගයක් එසේ පරිච්ඡින්න වූ ලෙස සැලකෙන දිනය ගැසට් පත්‍රයෙහි නිවේදනය කරනු ලැබිය යුතුය.

පාරිශ්‍රමික

42. මේ පනත යටතේ පිහිටුවනු ලැබූ ජාතික ක්‍රීඩා සභාවේ සහ දිස්ත්‍රික් ක්‍රීඩා කමිටුවල සාමාජිකයන්ට මුදල් පිළිබඳ විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයෙන් සහ ප්‍රමාණයන් අනුව පාරිශ්‍රමික ගෙවනු ලැබිය හැකිය.

අර්ථ නිරූපණය

43. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි -

"අමාත්‍යවරයා" යන්නේන් අග්‍රාමාත්‍යවරයා විසින් ක්‍රීඩා විෂය හෝ කාර්යය පවරනු ලැබූ අමාත්‍යවරයා අදහස් වන අතර "අමාත්‍යාංශය" යන්න ඒ අනුව තේරුම් ගත යුතුය.

"ක්‍රීඩාව" "ක්‍රීඩා" යන්නට අමාත්‍යාංශයේ ලේකම් විසින් මේ පනතේ කාර්යයන් සඳහා ක්‍රීඩා වශයෙන් පිළිගනු ලැබූ යම් ආකාරයක ක්‍රීඩා, විනෝද ක්‍රියා, ශාරීරිකාභ්‍යාස, කාය වර්ධන ව්‍යායාම සහ වෙනත් ව්‍යායාම ඇතුළත් වේ.

"ජාතික ක්‍රීඩා සංගමයක්" යන්නෙන් 28 වන වගන්තිය යටතේ නම් කරන ලද ක්‍රීඩාවක් නැතහොත් ක්‍රීඩා පන්තියක් පාලනය කරන සංගමයක්, ඒකාබද්ධ සංගමයක් හෝ මණ්ඩලයක් අදහස් වේ.

# 1993 අංක 47 දරන ක්‍රීඩා
# (සංශෝධන) පනත

**ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ -

1. මේ පනත 1993 අංක 47 දරන ක්‍රීඩා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ දීර්ඝ නාමය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් දීර්ඝ නාමයන් ආදේශ කරනු ලැබේ :-

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරණ පනතේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම

"ජාතික ක්‍රීඩා සභාව, දිස්ත්‍රික් ක්‍රීඩා කමිටු, ක්‍රීඩා පුහුණු කරන්න්ගේ හා කාර්මික නිලධාරීන්ගේ ජාතික සංගමය සහ ශ්‍රී ලංකාවේ ජාතික ඔලිම්පික් කමිටුව පිහිටුවීම සඳහා ද; ක්‍රීඩා අරමුදලක් පිහිටුවීම සඳහා ද; ජාතික ක්‍රීඩා සංගම් ලියාපදිංචි කිරීම හා පරිපාලනය කිරීම සඳහා සහ ක්‍රීඩා ශිල්පායතන පිහිටුවීම සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස සහ ඊට සම්බන්ධ හෝ අනුෂාංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි"

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියේ (අ) ඡේදයට ඉක්බිතවම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරිමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම

"(ආආ) ක්‍රීඩා පුහුණුකරන්නන්ගේ හා කාර්මික නිලධරයන්ගේ ජාතික සංගමයේ"

4. ප්‍රධාන ප්‍රඥප්තියේ I වන කොටසේ ශීර්ෂ පාඨයේ "දිස්ත්‍රික් ක්‍රීඩා කමිටු හා ශ්‍රී ලංකාවේ ජාතික ඔලිම්පික් කමිටුවක්" යන වචන වෙනුවට "දිස්ත්‍රික් ක්‍රීඩා කමිටු, ක්‍රීඩා පුහුණුකරන්නන්ගේ සහ කාර්මික නිලධරයන්ගේ ජාතික සංගමය හා ශ්‍රී ලංකාවේ ජාතික ඔලිම්පික් කමිටුවක්" යන වචන ආදේශ කිරීමෙන් ඒ කොටස මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ I වන කොටසේ ශීර්ෂ පාඨය සංශෝධනය කිරීම

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තියට ඉක්බිතවම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය ප්‍රධාන ප්‍රඥප්ත්යේ 17 අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතුය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 17 අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම

17අ. (1) "ශ්‍රී ලංකා ක්‍රීඩා පුහුණුකරන්නන්ගේ හා කාර්මික නිලධරයන්ගේ ජාතික සංගමය" යනුවෙන් හඳුන්වනු ලබන සංගමයක් පිහිටුවනු ලැබිය හැකිය.

(2) ක්‍රීඩා පුහුණුකරන්නන්ගේ හා කාර්මික නිලධරයන්ගේ ජාතික සංගමයේ සංයුතිය, බලතල, කර්තව්‍ය හා කාර්යය නියෝග මඟින් නියම කරනු ලැබිය යුතුය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 18වන වගන්තිය සංශෝධනය කිරීම

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තියේ (2) වන උපවගනිතිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උප වගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගක්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

" (2) ඒ කමිටුව පහත සඳහන් තැනැත්තක්ගෙන් සමන්විත විය යුතුය. :-

(අ) 3 වන වගන්තිය යටතෙ පත් කරනු ලබන, නිලබලයෙන් පත්වන සාමාජිකයකු විය යුතු ක්‍රීඩා අධ්‍යක්ෂවරයා

(ආ) ශ්‍රී ලංකාවේ අන්තර්ජාතිත ඔලිම්පික් කමිටුවේ සාමාජිකයන් කිසිවෙකු වෙතොත් ඒ සාමාජිකයෝ; ඔවුන් (ඇ) ඡේදය යටතේ පත්කර ඇත්නම් මිස, නිල බලයෙන් පත්වන ඡන්ද බලය නොමැති සාමාජිකයන් විය යුතුය.

(ඇ) මේ පනතේ පසුව දැක්වෙන විධිවිධාන අනුව ලියාපදිංචි කරන ලද එක් එක් ජාතික ක්‍රීඩා සංගමයෙන් නියෝජිතයන් දෙදෙනෙක්; එසේ වුවද ඒ සඳහා ඒ එක් එක් ජාතික ක්‍රීඩා සංගමය ඊට අදාළ අන්තර්ජාතික සම්මේලනයට අනුබද්ධ වූ හෝ එහි සංමාජිකයකු වූ හෝ සංගමයක් විය යුතු අතර, ඒ සංගමය නියෝජනය කරන ක්‍රීඩා ඔලිම්පික් ක්‍රීඩා වැඩසටහනට ඇතුළත් ක්‍රීඩා විය යුතුය.

කමිටුව විසින් වෙනත් ලියාපදිංචි කරන ලද ජාතික ක්‍රීඩා සංගම්වල නියෝජිතයන් හෝ ඔලිම්පික් ව්‍යාපාරයට විශිෂ්ට සේවකයන් සලසා ඇති හෝ සැලසිය හැකි තැනැත්තන් කමිටුවට අමතරව එක් කර ගත හැකිය; එසේ වුවද ඒ අමතරව එක් කරගන්නා සාමාජිකයන්ගෙන් කමිටුවේ ඡන්ද හිමි බහුතරය සකස් නොවිය යුතුය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 18අ වගන්තිය ඇතුළත් කිරීම

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තියට ඉක්බිතවම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 18 (අ) වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතුය :-

18 (අ) ක්‍රීඩා අධ්‍යක්ෂවරයා හා ඒ කමිටුවේ හැම සාමාජිකයකුම අවුරුදු හතරක කාලයක් සඳහා ධූරය දැරිය යුතුය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කිරීම

8. ප්‍රධන ප්‍රඥප්තියේ 21වන වගන්තිය අගට පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(ඉ) 18 වන වගන්තියේ 2 (අ) උපවගන්තියෙහි සඳහන් සාමාජිකයා නොවන ඒ කමිටුවේ අනුගාමී ධූර කාල දෙකක් සේවය කර ඇත්නම්

ප්‍රධාන ප්‍රඥප්තියේ 21අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 21අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතුය:-

ගිණුම් සහ විගණනය

21 අ. (1) ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුව යන III වන පර්ච්ඡේදය යටතේ ලියාපදිංචි කර ඇති සෑම ජාතික ක්‍රීඩා සංගමයක්ම විසින්, ඒ කමිටුවේ හා සංගමයේ ආදායම හා වියදම පිළිබඳව සහ වෙනත් සියලු ගණුදෙනු පිළිබඳව නිසි ගිණුම් පොත් පත් පවත්වාගෙන යාමට සැලැස්විය යුතුය.

(2) ඒ කමිටුව සහ ඒ සෑම සංගමයක් විසින්ම, ස්වකීය පොත් පත් එක් එක් වර්ෂයේ දෙසැම්බර් මාසයේ තිස් එක් වන දිනට තුලනය කිරීමට සැලැස්විය යුතු අතර, ඊළඟට එළඹෙන මාර්තු මස තිස් එක් වන දිනට ප්‍රථමයෙන් අවස්ථාවෝචිත පරිදි ඒ කමිටුවේ හෝ සංගමයේ පළමුවෙන් සඳහන් කළ දිනය තෙක් සාදන ලද වත්කම්වල සහ බැරකම්වල සාරාංශයක් ඇතුළත් ආදායම් හා වියදම්, ගිණුමක්ද, ශේෂ පත්‍රයක්ද පිළියෙල කිරීමට සැලැස්විය යුතුය.

(3) ඒ කමිටුවේ සහ ඒ සෑම සංගමයකම ගිණුම් විගණකාධිපතිවරයා විසින් විගණනය කළ යුතුය.

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතවම පහත දරක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 23වන වගන්තිය සංශෝධනය කිරීම

(ආආ) යම් ක්‍රීඩාවක් හෝ ක්‍රීඩා උත්සවයක් වෙනුවෙන අනුග්‍රහය දැක්වීම පිණිස, රජය, රාජ්‍ය සංස්ථාවක් හෝ රජයට අයත් ව්‍යාපාර ආයතනයක් විසින් ගෙවනු ලබන සියලු මුදල්

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය අගට පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 31වන වගන්තනිය සංශෝධනය කිරීම

"(4) යම් ජාතික ක්‍රීඩා සංගමයක් විසුරුවා හැරීම හෝ 32 වන වගන්තිය යටතේ යම් ජාතික ක්‍රීඩා සංගමයක ලියාපදිංචි කිරීම අත්හිටුවීම නියම කරමින් (1) වන උපවගන්තිය යටතේඅමාත්‍යවරයා විසින් නියමයක් කරනු ලබන අවස්ථාවක, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින්, ලියවිල්ලකින් වූ දැන්වීමක් මඟින්, ඒ ජාතික ක්‍රීඩා සංගමයේ (කිසියම් පොත් පත් සහ ලේඛන ද ඇතුළුව) සියලු චංචල දේපළ ක්‍රීඩා අධ්‍යක්ෂවරයා වෙත භාරදෙන ලෙස ඒ ජාතික ක්‍රීඩා සංගමයේ නිලධරයන්ට නියම කරනු ලැබිය හැකිය. මේ උපවගන්තිය යටතේ තමා වෙත පනවන ලද යම් නියම නිරීමක් අනුව ක්‍රියා කිරීම පැහැර හරින ලද යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්දහසක දඩයකට යටත් විය යුතුය."

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තියේ "ජාතික ක්‍රීඩා සහ දිස්ත්‍රික් ක්‍රීඩා කමිටුවල," යන වචන වෙනුවට "ජාතික ක්‍රිඩා සභාවේ ක්‍රීඩා පුහුණුකරන්නන්ගේ හා කාර්මික නිලධරයන්ගේ ජාතික සංගමයේ සහ දිස්ත්‍රික් ක්‍රීඩා කමිටුවල" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තිය සංශෝධනය කිරීම

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තියේ "ජාතික ක්‍රීඩා සංගමයක්" යන්නෙහි අර්ථකථනයට ඉකිබිතවම පහත දැක්වෙන අර්ථකථනය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :- ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තිය සංශෝධනය කිරීම

"රාජ්‍ය සංස්ථාවක්" යන්නෙන් 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ හැර, යම්කිසි ලිඛිත නීතියකින් හෝ ලිඛිත නිතියක් යටතේ හෝ පිහිටුවන ලද්දා වූ හෝ පිහිටවනු ලබන්නා වූ ද, ආණ්ඩුව විසින් ප්‍රදානයක් හෝ ණයක් වශයෙන් නැතහොත් වෙනත් ආකාරයකින් මුළු අරමුදල හෝ මුළු ප්‍රාග්ධනය නැතහොත් අරමුදලින් කොටසක් හෝ ප්‍රාග්ධනයෙන් කොටසක් හෝ සපයනු ලබන්නා වුවද සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් අදහස් වේ.

14. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය. අන්‍යානුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

# 1998 අංක 10 දරන ජාතික රාජ්‍ය සභාවේ

# ක්‍රීඩා (සංශෝධන) පනත

**ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ.

1. මේ පනත 1998 අංක 10 දරන ජාතික රාජ්‍ය සභාවේ ක්‍රීඩා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ දීර්ඝ නාමයේ යෙදෙන "ක්‍රීඩා ශිල්පායතන පිහිටුවීම සඳහා ද" යන වචන වෙනුවට "ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයක් පිහිටුවීම සඳහා ද" යන වචන ආදේශ කිරීමෙන් ඒ දීර්ඝ නාමය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන පනතේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියේ (ඉ) ඡේදය ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"(ඉ) ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයක් සහ අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන අනුබද්ධ ආයතන යම් ගණනක්."

ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තියට ඉහතින්ම වූ IV වන කොටසේ ශීර්ෂ පාඨය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන ශීර්ෂ පාඨය ආදේශ කරනු ලැබේ.

"ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයක් පිහිටුවීම."

ප්‍රධාන ප්‍රඥප්තියේ IV වන කොටසේ ශීර්ෂ පාඨය පතියෝජනය කිරීම

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) "ශිල්පායතනයක් හෝ ශිල්පායතන ගණනක් පිහිටුවන ලැබිය හැකිය." යන වචන වෙනුවට "ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයක් සහ අනුබද්ධ ආයතන යම් ගණනක් පිහිටුවන ලැබිය හැකිය." යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (ආ) ඡේදයේ "එම ශිල්පායතනවල" යන වචන වෙනුවට "එම ආයතනවල" යන වචන ආදේශ කිරීමෙන්;

(3) ඒ වගන්තියේ (ඇ) ඡේදයේ "එම ශිල්පායතන" යන වචන වෙනුවට "එම ආයතන" යන වචන ආදේශ කිරීමෙන්;

(4) ඒ වගන්තියේ පාර්ශව සටහනේ "ක්‍රීඩා ශිල්පායතන පිහිටුවීම" යන වචන වෙනුවට "ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයක් පිහිටුවීම" යන වචන ආදේශ කිරීමෙන්.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ වගන්තියේ "ශිල්පායතන" යන වචනය හෝ එහි ව්‍යාකරණානුකූල ප්‍රභේදය යෙදෙන කවර හෝ තැනක "ආයතන" යන වචනය ආදේශ කිරීමෙන්.

(2) ඒ වගන්තියේ පාර්ශව සටහනේ "ක්‍රීඩා ශිල්පායතනවලට"යන වචන වෙනුවට "ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය ආදියට" යන වචන ආදේශ කිරීමෙන්.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ වගන්තියේ "ඒ ශිල්පායතන" යන වචන හෝ එහි ව්‍යාකරණානුකූල ප්‍රභේදය යෙදෙන කවර හෝ තැනක "ඒ ආයතන" යන වචන ආදේශ කිරීමෙන්.

(2) ඒ වගන්තියේ පාර්ශව සටහනේ "ක්‍රීඩා ශිල්පායතනවල" යන වචන ආදේශ කිරීමෙන්.

8. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

# 2005 අංක 33 දරන ක්‍රීඩා (සංශෝධන) පනත

**ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ.

1. මේ පනත 2005 අංක 33 දරන ක්‍රීඩා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1973 අංක 25 දරන පනතේ 18 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. — ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන පනතේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම

> (ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියන් වන්නා වූ ද, නිල බලයෙන් පත්වන සාමාජිකයන් වන්නා වූ ද ජාත්‍යන්තර ඔලිම්පික් කමිටුවේ සාමාජිකයන් සිටී නම් එම සාමාජිකයන්."

3. ප්‍රධාන ප්‍රඥප්තිය 18අ වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ. — ප්‍රධාන ප්‍රඥප්තියේ 18අ වගන්තිය ප්‍රතියෝජනය කිරීම

> කමිටුවේ සාමාජිකයන්ගේ ධූර කාලය — 18අ. නිලබලයෙන් පත්වන සාමාජිකයන් හැර එම කමිටුවේ සෑම සාමාජිකයකුම අවුරුදු හතරක කාලයක් සඳහා ධූරය දැරිය යුතු ය."

4. ප්‍රධාන ප්‍රඥප්තිය 21 වන වගන්තියේ (ඉ) ඡේදය ඉවත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. — ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කිරීම

5. මේ පනත සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. — අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව